# මැටි වළං හා කපිරික්කදා

යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි හෙවත් යුදෙව් චින්තනයට ග්‍රීකයන්ගෙන් ලැබුණු ප්‍රධාන දෑ වනුයේ ස්වසිද්ධාත්මක ක්‍රමය, ආකෘතිකවාදය (ෆෝර්මැලිසම්) හා ඇරිස්ටෝටලීය ද්වි කෝටික න්‍යායයි. ද්විකෝටික න්‍යාය අන් රටවල ද භාවිතා වූ නමුදු එය ආකෘතික (ෆෝර්මල්) පද්ධතියක් බවට පත්කරනු ලැබුයේ ග්‍රීකයන් විසිනි. ස්වසිද්ධාත්මක ක්‍රමය, ආකෘතිකවාදය හා ද්විකෝටික න්‍යාය එකිනෙකට බැඳී ඇත. ග්‍රීක චින්තනයෙහි ප්‍රධාන ධාරාව ආකෘතිකවාදී විය. ආකෘතිකවාදී පද්ධතියක වස්තුවක් අනෙක් වස්තුවකින් වෙන් කර සැලකෙයි. මා දක්නා අයුරින් ආකෘතිකවාදී පද්ධතියක ප්‍රධාන ම ලක්‍ෂණය මේ වෙන් කිරීම ය. වස්තුවක් තවත් වස්තුවකින් වෙන් කර ගත හැක්කේ ආකෘතිය හේතුකොටගෙන ය. අපි උදාහරණයක් ලෙස මැටි පිඩක් ගනිමු. මැටි පිඩ ද්‍රව්‍ය ලෙස ගතහොත්, එහි වූ මැටි ස්වල්පයක ගුණ වෙනත් මැටි ස්වල්පයක ගුණයෙන් වෙනස් නොවේ. මැටි පිඬේ කොතැනින් මැටි ලබා ගත්ත ද ඒ මැටිම වෙයි. දැන් මෙ මැටි යම් ප්‍රමාණයකින් වළඳක් සාදා ගත්තේ යැයි සිතමු. ඒ වළඳට හැඩයක්, ආකෘතියක් ඇත. මැටි, මැටි වශයෙන් ගත්කල වෙනස් නොවුණ ද වළඳක් ඒ වළඳ තැනූ මැටි පිඬේ ම වෙනත් මැටි ටිකකින් තනන ලද වෙනත් වළඳකින්, රූපය වශයෙන් ගත්කල, වෙනස් වෙයි. මැටි, මැටි ලෙස ගත්කල වෙනස් නොවුණ ද, වළඳක් වෙනත් වළඳකින් වෙනස් වෙයි. ඇරිස්ටෝටල් පඬිතුමා ඇතුළු වෙනත් ග්‍රීක ආකෘතිකවාදීන්ට අනුව යම් වස්තුවක් අනෙක් වස්තුවකින් වෙනස් වන්නේ රූපය හෙවත් ආකෘතිය හේතුකොටගෙන ය. ඕනෑම වළඳකට එයට ම ආවේණික වූ ආකෘතියක් ඇත. එක සමාන ලෙස පෙනෙන වළං දෙකක් වුව ද ඉතා සියුම් ව නිරීක්‍ෂණය කළහොත් එකිනෙකින් වෙනස් වන බව දැනගත හැකි ය. එසේ වුව ද නිරීක්‍ෂණ මට්ටම අනුව වස්තු දෙකක් ආකෘතික ලෙස සමාන නම් ඒ වස්තු එකිනෙකට සමාන ලෙස ගැනීමේ බාධාවක් නැත.

ආකෘතිකවාදීන් ට අවශ්‍ය වූයේ වස්තුවල අනන්‍යතාවය තේරුම් ගැනීමට ය. එහි දී ඔවුහු ද්‍රව්‍ය යන්න ආකෘතියෙන් වෙන් කර සැළකූහ. ද්‍රව්‍ය වශයෙන් ගත්කල මැටි එක ම වුව ද විවිධ වළං ඉන් නිර්මාණය කර ගත හැකි ය. ආකෘතිය වස්තුවකට අනන්‍යතාවයක් ලබා දෙන අතර වස්තුව අනෙක් වස්තූන්ගෙන් වෙන් කරයි. ආකෘතිකවාදීහු ද්‍රව්‍යයෙන් ලබා ගන්නා විවිධ වස්තුවල පමණක් නොව මිනිසුන්ගේ ද අනන්‍යතාවය ගැන සඳහන් කළහ. ග්‍රීක ආකෘතිකවාදීන්ට අනුව මිනිසුන් අන් අයගෙන් වෙනස්වන්නේ ආත්මය නිසා ය. එකිනෙකාගේ ආත්ම වෙනස් වෙයි. ඒ ඒ පුද්ගලයාට අනන්‍යතාවයක් ලබා දෙන්නේ මේ වෙනස් වූ ආත්මය ය. මේ පිළිබඳ ගැටළු ඇත. එහෙත් අප මෙහි දී තේරුම් ගත යුතු දෙයක් නම් මිනිසුන් සම්බන්ධයෙන් ශරීරයේ හැඩයට, රූපයට වඩා ආත්මය ඒ ඒ පුද්ගලයාගේ අනන්‍යතාවය නිර්ණය කරන්නේ යැයි ගැනීමෙන් ග්‍රීකයෝ මිනිසුන් අනෙක් සියල්ලන්ගෙන් ම වෙන් කළ බව ය. අන් සියල්ල හැඩයෙන්, රූපයෙන් අනන්‍යතාවය ලබද්දී මිනිස්සු ආත්මය ඔස්සේ අනන්‍යතාවය ලබා ගත්හ.

කෙසේවෙතත් ග්‍රීක ආකෘතිකවාදීහු වස්තු වෙනත් වස්තූන්ගෙන් වෙන් කර අධ්‍යයනය කළහ. ඒ වෙන් කිරීමත් සමග ඔවුන්ට වස්තුවක් ඒ වස්තුවට ම සමාන වේය, හා ආකෘතික වශයෙන් වෙනස් වෙනත් වස්තුවකට අසමාන වේය යන අදහස ඇති විය. ඇරිස්ටෝටලීය න්‍යායෙහි පදනම එය වෙයි. ඇරිස්ටෝටලීය න්‍යාය ඇතැම් විට රූපික (ආකෘතික - ෆෝර්මල් යන්නට ආකෘතික මෙන් ම රූපික යන වචනය ද ඇතැම් අවස්ථාවල යොදා ගැනේ.) න්‍යාය (ෆෝර්මල් ලොජික්) ලෙස ද තවත් සමහර විටෙක රූපික ද්විකෝටික න්‍යාය (ෆෝර්මල් ටූ වැලුඩ් ලොජික්) ලෙස ද හැඳින්වෙයි. වස්තුවක් අන් වස්තූන්ගෙන් වෙන් කර ගත හැකි බැවින් ඒ වස්තුව සංකේතාත්මක ව A ලෙස දැක්විය හැකි ය. මීළඟට කියැවෙන්නේ ඕනෑම වස්තුවක් ඒ වස්තුවට ම සමාන බව ය. එය A=A ලෙස දැක්වෙයි. A නම් වස්තුව ආකෘතික වශයෙන් වෙනස් B නම් වෙනත් වස්තුවකට අසමාන බව A =/= B ලෙසින් දැක්විය හැකි ය. (වස්තුවක් ඒ වස්තුවට ම සමාන වේය යන්නෙන් වස්තුව වෙනස් නොවේ යන්න ද ගම්‍ය වෙයි. වස්තුවක් දිගින් දිගට ම එයට ම සමාන විය හැක්කේ එය වෙනස් නොවන්නේ නම් පමණකි. මෙහි දී අපි ඒ ගැන එතරම් අවධානයක් නොකරමු.) එමෙන් ම A නම් වස්තුව ආකෘතික වශයෙන් B නම් වස්තුවට සමාන නම් එය A = B ලෙස දැක්විය හැකි ය. ආකෘතික ව ගත් කල B එක්කෝ A ට සමාන විය යුතු ය නැත්නම් අසමාන විය යුතු ය. මේ ද්විකෝටික න්‍යායයි. යමක් කෝටික නැත්නම් අන්ත දෙකින් එකක් විය යුතු ය. අන්ත දෙක ම විය නොහැකි ය. එය එක්කෝ B = A නැත්නම් B=/=A ලෙස ප්‍රකාශ කළ හැකි ය.

© Prof. Nalin De Silva

මෙහි ගැටළු නැතිවා නොවේ. වස්තුවක් තවත් වස්තුවකට සමාන වන්නේ ආකෘතික ව ය. එනම් රූපයෙනි. එහෙත් ඒ දෙවැනි වස්තුව පළමු වස්තුව ම නොවේ. දෙවැනි වස්තුවට වෙන ම අනන්‍යතාවයක් ඇත. ඒ දෙවැනි වස්තුව එලෙස වෙන ම අනන්‍යතාවයක් ලබා ගන්නේ කෙසේ ද? රූපික ව, එනම් ආකෘතික ව සමාන වුව ද වෙනස්කම් තිබිය හැකි බව ආකෘතිකවාදීන්ට පිළිගැනීමට සිදුවෙයි. එහෙත් මේ වෙනස්කම දැනගන්නා ක්‍රමයක් ආකෘතිකවාදය තුළ නොවෙයි. A නම් යම්කිසි වස්තුවක් දී ඇති කල A නොවන වස්තු ~ A යන සංකේතයෙන් දැක්වුවහොත් ~ A යන්නෙන් අදහස් කරන්නේ කිනම් වස්තු ද? A ට ආකෘතික වශයෙන් සමාන වස්තු ~ A ලෙස දැක්විය හැකි ද? එසේ නම් සමාන යන්නෙහි තේරුම කුමක් ද? එසේ දැක්විය නොහැකි නම් A ට ආකෘතික වශයෙන් සමාන වස්තු A ම වේ ද? A නම් වස්තුව A නොවන වස්තුවකට සමාන විය නොහැකි ය. මෙය A =/= ~ A ලෙස දැක්විය හැකි ය. දැන් B යනු A ට ආකෘතික වශයෙන් සමාන වන වස්තුවක් නම් B = A වෙයි. ප්‍රශ්නය වනුයේ B යනු A නොවන වස්තුවක් ද යන්න ය.

මෙවැනි ගැටළු තිබිණ ද, ආකෘතිකවාදය, රූපික ද්විකෝටික න්‍යාය, ස්වසිද්ධාත්මක ක්‍රමය ඉතා ප්‍රබල විය. ඒ අනුසාරයෙන් ග්‍රීක චින්තනය මත ගොඩ නැගුණු දැනුම් පද්ධතිය මගින් එකල ග්‍රීකයෝ තමන් දැන සිටි ලෝකයෙහි අනෙක් දැනුම් හකුළුවා ඉදිරිපත් කිරීමට ද නවතම වූ දැනුම් නිර්මාණය කිරීමට ද සමත් වූහ. ග්‍රීක චින්තනයෙහි තිබූ මේ ලක්ෂණවල ප්‍රතිඵලයක් වූයේ සංගත ව අදහස් ඉදිරිපත් කිරීමට ඔවුන් මනා පරිචයක් ලබා ගැනීම ය. ග්‍රීක චින්තනය මත පදනම් වූ යම් දැනුම් පද්ධතියක වස්තු වෙන් කර ගැනෙයි. ඕනෑම වස්තුවක් යම්කිසි ගොඩක් තුළ වර්ගීකරණය කෙරෙයි. වස්තුවක් ගතහොත් එය එක්කෝ යම්කිසි ගොඩකට අයත් වෙයි. නැතහොත් ඒ ගොඩට අයත් නොවෙයි. අතරමැද අවස්ථා නෙතිබෙයි. දැනුම් පද්ධතියක එකිනෙකින් වෙන් වූ ස්වසිද්ධි හෙවත් ප්‍රත්‍යක්ෂ වෙයි. ඒ දැනුම් පද්ධතියෙහි අනෙක් සියළු දැනුම් ඒ ස්වසිද්ධිවලින් ද්විකෝටික න්‍යාය තුළ තර්කයෙන් නිගමනය, එනම් අපෝහනය කෙරෙයි. වෙනත් වචනවලින් කියන්නේ නම් ඒ දැනුම් පද්ධතියෙහි වලංගු වූ දැනුම් සියල්ල එලෙස ස්වසිද්ධිවලින් අපෝහනය කිරීමට හැකි විය යුතු වෙයි.

මේ සියල්ලෙහි ප්‍රතිඵලය වූයේ ද්විකෝටික න්‍යාය තුළ සංගත වූ සමස්තයක් දැනුම් පද්ධතියක් ලෙස නිර්මාණය වීම ය. වෙනත් කිසි ම චින්තනයක නොමැති මේ සංගත බව දැනුම් ආධිපත්‍යයෙහි දී විශාල වශයෙන් බලපෑවේ ය. අපේ රටවල මෙවැනි සමස්ත සංගත භාවයක් අත්කර ගැනීමට උනන්දුවක් නොතිබුණි. අපේ, විශේෂයෙන් ම සිංහලයන්ගේ සංගත බව ඉතා සීමිත වෙයි. අප පරස්පරයන් තුළ ක්‍රියා කිරීමට පුරුදු වී ඇත්තේ ග්‍රීක චින්තනය අපට නුහුරු බැවිනි. අපට ඇත්තේ ඉතා කුඩා පරාසයක් තුළ ක්‍රියාත්මක වන සංගත බවකි. අපව පහසුවෙන් රැවටීමට හැකි වන්නේ ද එබැවිනි. අද ඊනියා සාමයක් ගැන තොර තෝංචියක් නැතිව කතා කෙරෙයි. සිංහල මිනිස්සු ඉතා කෙටි පරාසයක් තුළ සාමයට කැමැත්තක් දක්වති. බෝම්බ පුපුරන්නේ නැත්නම් ඇත්තේ සාමයක් යැයි අපි සිතමු. අපේ සංගත බව එතැනට පමණක් සීමාවෙයි. ඊනියා සාමය වෙනුවෙන් අප ලබා දෙන්නේ කුමක් ද, අප නැතිකර ගන්නේ කුමක් ද ආදිය අපට ප්‍රශ්න නොවේ.

සිංහලයන්ට ඇත්තේ කෙටි මතකයක් යැයි බොහෝ විට කියැවෙයි. මෙහි පදනම කුමක් ද? දිගු මතකයක් තුළ සංගත බව සඳහා විශාල පරාසයක් ලැබෙයි. එහෙත් එවැනි විශාල පරාසයක් තුළ සංගත වීම අපට නුහුරු ය. අපට සංගත වීමට හැකි කුඩා පරාසයක් පමණක් අපි අපේ මතකයට කැඳවමු. අපට ප්‍රවාද ඇත්තේ ඉතා අඩුවෙනි. ප්‍රවාදයක් නිර්මාණය කළ හැක්කේ සංසිද්ධි රාශියක් සඳහා සංගත ව බලපාන කරුණු නිරීක්ෂණය කිරීමෙනි. මෙහි දී යම් දුරකට වියුක්තව සිතීමට ඇති හැකියාව ද බලපායි. ග්‍රීකයෝ යුදෙව්වන් තරම් වියුක්ත ව නොසිතූහ. එහෙත් ඔවුන්ට ද අද බටහිරයන්ට මෙන් නොවුණ ද ප්‍රවාද ගොඩ නගා ගැනීමට හැකි විය. වත්මන් බටහිරයන්ගේ චින්තනයට වියුක්ත බව ලැබී ඇත්තේ යුදෙව් චින්තනයෙනි. වත්මන් බටහිර චින්තනය යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය ලෙස හැඳින්වෙන්නේ ඒ සම්භවයන් සලකා බැලීමෙන් ය.

අපට ඉතා විශිෂ්ට තාක්ෂණයක් තිබිණි. පැරණි වාරි මාර්ග කර්මාන්ත එයට දෙස් දෙයි. ඉතා විශාල දාගැබ් නිර්මාණය කිරීමට අපට හැකි වූයේ ද මේ තාක්ෂණයේ මහිමයෙනි. අපට ඉතා දියුණු වෙදකමක් තිබූ බව ද පැහැදිලි ය. ලෝකයේ ම පැරණි ම රෝහල් අනුරාධපුරයේ හා මිහින්තලයේ දැකගත හැකි ය. අපට සංගීතයක් තිබුණු බව ද වංශකතාවලින් මෙන් ම පැරණි සාහිත්‍යයෙන් ද දැනගත හැකි ය. විජය රජු කුවේණියගේ ආධාරයෙන් යක්ෂයන්

© Prof. Nalin De Silva

නැසීමට යන විට යක්‍ෂයෝ සංගීතයෙන් මත් වී සිටියහ. (අද ද අපේ සෙබළු සංගීත සාජ්ජ පවත්වමින් සිටින විට කොටි ආක්‍රමණවලට ගොදුරු වෙති!). ඉසුරුමුණි කෞතුකාගාරයෙහි විවිධ සංගීත භාණ්ඩ වාදනය කරන්නන්ගේ පිළිරූ අපට දැක ගත හැකි ය. ගුත්තිල ඇදුරු තුමාගේ සංගීතයෙන් මත් වූ ඇතැම් ගැහැණු තම ඇකයේ සිටි දරුවන් වැටුණු බව නොදත්හ. ගුත්තිල කාව්‍යයට ඒ අදහස ඇතුල් වූයේ අපේ සමාජයේ සංගීතයක් තිබුණු බැවින් හා සංගීත රස විඳි ගැහැණුන් එදා ද සිටි බැවිනි. සංගීතය සිංහලයන්ට ලැබුණේ පුරුතුගීසි කපිරිඤ්ඤා සංගීතයෙන් පසුව යැයි ඇතැම්හු බයිලා කියති.

එහෙත් මේ සියල්ල තිබිය දී අප එතරම් ප්‍රවාද ගොඩ නගා නොමැති බව ද පැහැදිලි ය. වාරි මාර්ග තාක්‍ෂණයක් තිබුණ ද වාරි මාර්ග පිළිබඳ විද්‍යා දැනුමක් අපට ඇතැයි කිව නොහැකි ය. එනම් සංගත වාරිමාර්ග විද්‍යා පද්ධතියක් අපට නැත. සංගීත ශිල්පයක් තිබුණ ද සංගීත විද්‍යාවක්, ශාස්ත්‍රයක් තිබී ඇති බවක් නොපෙනෙයි. අපේ සිංහල වෛද්‍ය ශිල්පයෙහි ද සමස්ත ක්‍ෂෙත්‍රයක් පුරා විහි දී යන ප්‍රවාද නැත. අපේ සමාජය ශාස්ත්‍රයට වඩා ශිල්පයට බර වී ඇත. අද ද ඒ බව පැහැදිලිව ම දක්නට ලැබෙයි. අපට ඉතාමත් ගැඹුරු දහමක් ඇත. එහෙත් බෞද්ධ සාහිත්‍යයෙහි පෙනෙන අන්දමට අප එතරම් ප්‍රවාද ගොඩ නගා නැත. බෞද්ධ ප්‍රවාද ගොඩනැගුවෝ බොහෝ විට බ්‍රාහ්මණයෝ වූහ. ථෙරවාද සම්ප්‍රදාය තුළ වුව ද ප්‍රවාද ගොඩනගා ඇත්තේ ප්‍රධාන වශයෙන් ම දකුණු ඉන්දීය බ්‍රාහ්මණ කුලයෙහි උපන් භික්‍ෂූන් වහන්සේ බව පැහැදිලි ය. භාරතයේ මෙන් සංගීත ශාස්ත්‍රයක්, ආයුර්වේදය වැනි වෛද්‍ය විද්‍යාවක් අපට නැත. භාරතයේ සංගීතයේ වේවා, ආයුර්වේදයේ වේවා, දර්ශනයේ වේවා ප්‍රවාද ගොඩනැගුවන් බ්‍රාහ්මණයන් යැයි සැලකීම වැරදි නැත. බ්‍රාහ්මණ චින්තනය, සිංහල චින්තනයට වඩා ප්‍රවාද ගොඩ නැඟීමට පදනමක් සපයයි. එහෙත් භාරතීය බ්‍රාහ්මණ චින්තනය වුව ද බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය තරමට ප්‍රවාද ගොඩ නැඟීමට රුකුල් නොදෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva